# තනතුරු - ඇබෑර්තු

**මහනුවර මහා නගර සභාව**

මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත

සිවිල් ඉංජිනේරු සේවය ලබාගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සිවිල් ඉංජිනේරු සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සපයන සේවාවේ නාමය සඳහන් කර 2026.08.28 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| | | | |
|---|---|---|---|
| 1. | තනතුරු සංඛ්‍යාව | : | තනතුරු 10 |
| 2. | වයස | : | සියලුම අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| 3. | මාසික දීමනාව | : | මාසික දීමනාව රු. 1,24,950 කි. (මාසයකට අවම දින 25 ක් රාජකාරී කල යුතුය.) |
| 4. | අධ්‍යාපන සුදුසුකම් | : | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක වසර 04 ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය (BSc - Civil Engineering ) ලබා තිබීම. |
| 5. | වෘත්තීය සුදුසුකම් | : | ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ (ECSL) ලියාපදිංචිව සිටීම; සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා තිබීම. |
| 6. | තෝරා ගැනීමේ ක්‍රමය | : | අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ. |

සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන සේවකයින් පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

1. දිනකට අවම පැය 08 ක කාලයක් (සාමාන්‍ය රාජකාරි වේලාව තුළ) සේවාව සැපයිය යුතුය.
2. පූර්ණ කාලීනව රාජකාරින්හි නියැලිය යුතුය.
3. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා දිනයන්හි සේවයේ යෙදිය යුතු අතර සුවිශේෂී රාජකාරි සඳහා ඉරිදා හා රජයේ නිවාඩු දිනයන්හි සේවය සැපයීම සඳහා කැඳවනු ලැබිය හැක. එවන් අවස්ථාවන්හිදී උක්ත මාසික දීමනාවට යටත්ව සේවය සැපයීම සිදු කළ යුතු වේ.
4. සේවා සැපයීමට අදාළ අවු. 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

7. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

*සටහන* :- මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි,
අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 අගෝස්තු මස 07 වැනි දින.